// ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,878/4 — 1969 නොවැම්බර් 5 වැනි බදාදා — 1969.11.5

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**ආපා 5/10/69/1 දරණ ආහාර මිල ආඥාව.**

**අතිරේක ආහාර ද්‍රව්‍ය (එකතු කළ යුතු නිත්‍ය මිළ).**

### මිළ පාලන පනත

**නියෝගය**

අම්පාර පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් තන්තිරි මුදලිගේ දෙන් ප්‍රැන්සිස් රොබට් වන මම,19 50 අංක 29 දරණ මිළ පාලන පනතේ (173 වන අධිකාරය) 3 (2) වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව—

1. 1968 ජුලි මස 19 වන දින අංක 14,811/1 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ 1969 ජුලි මස 14 වෙනි දින අංක ආපා 5/10/68/2 දරණ ආහාර මිළ ආඥාව සහ 1968 ජනවාරි මස 19 වෙනි දින අංක 14,785/1 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ 1968 ජනවාරි මස 17 වෙනි දින අංක ආපා 5/17/68 දරණ ආහාර මිළ ආඥාවත් වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

2. මෙහි වූ උපලේඛනයේ 3 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිළ පාලන පනත යටතේ කොළඹ මහා නගර සභා ප්‍රදේශය තුළ තොග වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම තොග මිළ ලෙස එවකට නියම කර ඇති මිළ ඒ උපලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ දළ බර හොණ්ඩරයක් ඒ උපලේඛනයේ දෙවන තීරයේ නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහලින් නොවිකිණිය යුතු උපරිම තොග මිළ විය යුතු ලෙස, වහාම බලපැවැත්වෙන පරිදි නියම කරමි.

3. මෙහි වූ උපලේඛනයේ 4 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිළ පාලන පනත යටතේ කොළඹ මහා නගර සභා ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම සිල්ලර මිළ ලෙස එවකට නියම කර ඇති මිළ, ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ ශුද්ධ බර රාත්තලක් ඒ උපලේඛනයේ 2 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශයේ හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහලින් නොවිකිණිය යුතු උපරිම සිල්ලර මිළ විය යුතු ලෙස වහාම බලපැවැත්වෙන පරිදි නියම කරමි.

4. තවද මෙම ආඥාවේ කාර්යය සඳහා—

(අ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක යම් ප්‍රමාණයක් නැවත විකිණීමේ කාර්යය සඳහා වූ යම්කිසි විකිණීමක් හෝ ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් වූ යම් විකිණීමක් තොග වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත් ;

(ආ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස තෝ දළ බර හොණ්ඩරයකට අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත් නියම කරමි.

5. මෙම ආඥාවෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන කිසිම ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිම තැනැත්තෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

6. මෙම ආඥාවෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ වාහනයක හෝ මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමීත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම ඒ ද්‍රව්‍යයෙන් ප්‍රමාණවත් කොටසක් සුදුසු භාජනයක බහා එම ද්‍රව්‍යය සඳහා මෙම ආඥාවෙන් නියමිත උපරිම මිළ උසින් අඟලකට වඩා අඩු නො වූ ඉලක්කම් වලින් මිළ සූචකයෙක හෝ මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍යය හා ඒ සඳහා නියම කරන ලද උපරිම මිළ යම් ගනුදෙනු කරුවෙකුට පැහැදිළිව පෙනෙන සේ ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි ප්‍රදර්ශනය කළ යුතු බව නියම කරමි.

7. මෙම ආඥාවේ කාර්යය සඳහා " රාත්තල " හෝ " රා." යන්නෙන් ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර සැලකිය යුතු බව නියම කරමි.

8. මෙම ආඥාවෙන් උපරිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම ගැනුම්කරු ඉල්ලුවොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් විකිණීම සිල්ලර වශයෙන් ද, නැතහොත් තොග වශයෙන් ද, යන බව ඇතුළත් කුවිතාන්සියක් ගැනුම් කරුට දිය යුතු බව නියම කරමි.

9. මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණූ විට, ඒ විකුණනු ලැබූ ද්‍රව්‍යය යම් දෙයක ඔතනු ලැබේන ම් නැතහොත් බහා ලනු ලැබේ නම් එහි මිළත් උපලේඛනයේ 3 වන සහ 4 වන තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් විය යුතු බව නියම කරමි.

1969 ඔක්තෝබර් මස 31 වන දින පෙරවරු 10.00 ට අම්පාර කච්චේරියේ දී අත්සන් තබන ලදී.

ටී. ඩී. ඇප්. රොබට්,
අම්පාර දිස්ත්‍රික්කයේ
සහකාර මිළ (ආහාර) පාලක තැන.

## උපලේඛනය

| 1 වන තීරය<br>ද්‍රව්‍යය | 2 වන තීරය<br>ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය | 3 වන තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් විකිණිය හැකි කොළඹ මහා නගර සහා ප්‍රදේශය සඳහා නියමිත මිළට වඩා වැඩි අධිකය<br>රු. ශ. | 4 වන තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි කොළඹ මහා නරග සහා ප්‍රදේශය සඳහා නියමිත මිළට වඩා වැඩි අධිකය<br>රු. ශ. |
|---|---|---|---|
| චින්තාමණී කඩල<br>මැ ඇට (කව්පිස්)<br>මුං ඇට<br>කොණ්ඩ කඩල<br>පියලි නොකළ උළුඳු<br>උළුඳු පරිප්පු<br>කඩල පරිප්පු<br>තෝර පරිප්පු<br>කොත්තිමල්ලි<br>රතුළුනු<br>ළූනු (රතුළූනු හැර වෙනත් සියලුම වර්ග)<br>මසූර් පරිප්පු<br>චීන වටානා පරිප්පු | 1. කරවාහුපත්තු, නින්දවූර්පත්තු හා සම්මාන්තුරපත්තු ප්‍රදේශයන් * ... | 6 0 ... | 0 07 |
| | 2. අක්කරපත්තු හා වැව්ගම්පත්තු ප්‍රදේශයන් * ... | 6 20 ... | 0 07 |
| | 3. පානමපත්තු ප්‍රදේශය * ... ... | 6 50 ... | 0 07 |

* ප්‍රාදේශීය ආදයම් පාලක නිලධාරීන්ගේ ප්‍රදේශයන් හැඳින්වේ.

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු ලෙස නියම කර ඇති මිළ නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ වන අතර ඊට ඉහලින් ඒ ද්‍රව්‍ය නොවිකිණිය යුතුය.

11–38

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි.